# ආයුර්වේදෝක්ත ක්වාථ පරිභාෂාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කුමාර ජී. යූ. ඒ.[1], ගම්ලත් එන්. ඩබ්. ජී. එන්. ඩී.[2]

[1]කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

[2]චිකිත්සා අධ්‍යයනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

## සංක්ෂිප්තය

කෂාය යෝනිය අනුව මධුර, අම්ල, කටු, තික්ත සහ කෂාය වශයෙන් ද කෂාය කල්පනා අනුව ස්වරස, කල්ක, ක්වාථ, හිම සහ ඵාණ්ඨ වශයෙන් ද කෂාය පරිභාෂාව දෙයාකාරයකින් පංචවිධ වේ. මෙහි ක්වාථ යන්නට ශෘත, නිර්යූහ සහ කෂාය යනාදිය පර්යායවාචී වේ. ආයුර්වේදෝක්ත පංචවිධ කෂාය පරිභාෂාවන් අතුරින් ක්වාථ පරිභාෂාව පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක් මෙහි දී සිදු කරන ලදී. ආයුර්වේද වෛද්‍යවරුන් කෂාය සංස්කරණය සඳහා යොදා ගන්නා ක්‍රමවේදයෙහි නිරවද්‍යභාවය චිකිත්සා සාඵල්‍යතාවට සෘජු ව බලපාන බැවින් කෂාය පරිභාෂාව පිළිබඳ දැනුම ගවේෂණය ඉතා වැදගත් වේ.  මේ සඳහා වෘද්ධත්‍රය සහ ලඝුත්‍රය යන ආයුර්වේද මූල ග්‍රන්ථ, චක්‍රදත්තය, භෛෂජ්‍ය රත්නාවලි ආදි චිකිත්සා ග්‍රන්ථ සහ මධ්‍යකාලීන ආයුර්වේද විචාර ග්‍රන්ථ පරිශීලනය කරන ලදී. ක්වාථ සංස්කරණය සඳහා යොදා ගන්නා වියළි ද්‍රව්‍ය මෙන් දහසය ගුණයක් ජලය යෙදිය යුතු බව සියලු මූලාශ්‍රයවල සඳහන් ව ඇති අතර ඇතැම් තැනක දී යොදන ඖෂධ ප්‍රමාණය වැඩි වන විට දැමිය යුතු ජල ප්‍රමාණය අඩු කළ යුතු බව විස්තර කර ඇත. ක්වාථ සිඳවීමේ දී වෘද්ධත්‍රය සහ චක්‍රදත්තයට අනුව හතරෙන් එක අනුපාතය ද ලඝුත්‍රය සහ භෛෂජ්‍ය රත්නාවලියට අනුව අටෙන් එක අනුපාතය ද නිර්දේශිත ය. නමුත් හාරිතාචාර්යයන් මේ පිළිබඳ දීර්ඝ ව විස්තර කරමින් පාචන, දීපන, ශෝධන, ශමන, තර්පණ, ක්ලේදන සහ ශෝෂණ යන සප්තවිධ කෂාය පිළිවෙළින් අර්ධයකට, දහයෙන් එකට, අර්ධයකට, අටෙන් එකට, උතුරුවා ගැනීමෙන් පමණක් හතරෙන් එකට සහ දහසයෙන් එකට යන අනුපාතයන්ට සිඳවිය යුතු බව පැහැදිලි කර ඇත. මේ අනුව කෂාය සංස්කරණයේ දී යෙදිය යුතු ජල ප්‍රමාණය වියළි ද්‍රව්‍ය මෙන් දහසය ගුණයක් විය යුතු බවත් නමුත් ද්‍රව්‍ය ප්‍රමාණය වැඩි වන විට ජලය යොදන අනුපාතය අඩු කිරීම සාධාරණ බවත් ක්වාථ සිඳවිය යුතු අනුපාතය පාචන, දීපන ආදි වශයෙන් යොදන අවස්ථාවට අනුව තීරණය කිරීම සාධාරණ බවත් නිගමනය කළ හැක.

**ප්‍රමුඛ පදඃ** පංචවිධ කෂාය, කෂාය කල්පනා, ශෘත, නිර්යූහ

**විද්‍යුත් ලිපිනයඃ** guakumara@gmail.com